

# තරණිගෙ දුරකථන ඇමතුමත් සමඟ කැළඹීමක්



කාලය නොදැනිම ගෙවී යමින් අවුරුදු උත්සවයේ අවසන් භාගයටත් පැමිණ ඇත. ගොම්මන් කළුවරින් මුළු සරසවියම වසාගන තිබුණද විදුලි අලෝකය නිසා එය එතරම් දැනුණෝ නැත. තරණිත් පෙනෙන මානයක නැත සමහර විට ඇය රෑ බෝ වීමට කලින්ම බෝඩිමට ගිහින් විය හැකිය. තරණිගේ මතකයත් සමඟ දින සති ගෙවී ගියද තරණි නැවත මුණ ගැසුණෝ නැත. තරණි බැලීමට සරසවියට යාමට අවශ්‍ය වුවද කාලය එයට හරස් වී ඇත. තරණිගේ දුරකථන අංකය මා සතු වුවද ඇයට දුරකථන ඇමතුමක් ගැනිමට නොහැකිය. සමහර විට ඇය කෙරෙහි අදහසක් මා සිත තුළ පවතින බව ඇය නොදන්නවා විය හැකිය.

දිනක් මා කුරුණෑගල ශක්‍යා උසස් අධ්‍යාපන  ආයතනයේ බැංකුකරණ විභාගය සඳහා දේශන මාලාවක් මෙහෙය වමින් සිටින අතර තුර මගේ දුරකථනයට දුරකථන ඇමතුමක් ආවේ මා මීට පෙර නොදන්නා දුරකථන අංකයෙකිනි. ඔහු මට ඇමතුවේ මා පංතිය තුළ ඉන්නේද කියා දැන ගැනීමේ අදහසිනි. එය තරණිගේ දුරකථන අංකය හා සැසඳීමේ දී වෙනස් වන්නේ අවසන් අංක දෙක පමණි. මා සිත තුළ ඇති වූයේ නොසන්සුන් බවකි. ඒ වෙන කිසිවක් නිසා නොව බොහෝ දුරට එක ළඟින් ගිය අංක භාවිතා කරනුයේ ආදරවන්තයින් විසින් නිසාවෙනි. සිතේ වූ  නොසන්සුන් බව ශිෂ්‍යයින්ට නොපෙන්වා මම පාඩම කරගෙන යාමට සුදානම් විය. පංතිය තුළ සකච්ජා වෙමින් පැවති පාඩම වූයේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර පිළිබඳවයි.

කිසියම් ආර්ථිකයක් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත කටයුතු කිරීමට නම් කොන්දේසි දෙකක් ඉටු කර ගන්න ඕනේ. එකක් ආර්ථිකය තුළ පවත්නා වර්තමානයේ නිෂ්පාදනයට යොදාගත හැකි සියලුම සම්පත් නිෂ්පාදනයට යොදා ගන්න ඕනේ. අපි උදාහරණයකින් මේ පිළිබඳව අවබෝධ කරගන්න උත්සහ කරමු, මම දේශනය කරමින් සිටියද මාගේ සිත ඇත්තේ මට දුරකථන ඇමතුම දුන්නේ කවුරුන් ද කියන මානසිකත්වයි.

දේශනය ඉදිරියට කරගෙන ගියේ සිතේ පවත්නා නොසන්සුන් බව ඉවත් කර ගැනීමට උත්සහ දරමිනි. වී නිෂ්පාදනය ගත්තොත් අපි වී නිෂ්පාදනයට යොදාගනු ලබන සම්පත් මොනවාද ? සිසුන්ගෙන් නොයෙකුත් ආකාරයේ පිළිතුරු ලැබෙන්නට විය. සමහරු උත්තර දෙනුයේ ඔවුන් මේ ප්‍රකාශ කරන්නේ මොනවාද කියාවත් නොදැනය. හරි, වී නිෂ්පාදනයට අවශ්‍යයි කුඹුරු, මී ගවයින්, උදලු ..... ආර්ථිකය තුළ පවත්නා සියලුම සම්පත් නිෂ්පාදනයට යොදා ගන්න ඕනා කියන්නේ, ඔයා මේ කියන කුඹුරු ගත්තොත් ආර්ථිකය තුළ පවත්නා සියලුම කුඹුරු වී නිෂ්පාදනය සඳහා යොදා ගන්න ඕනේ, ආර්ථිකය තුළ කිසිදු කුඹුරක් පුරන් වී තිබිය නොහැක. වී නිෂ්පාදනයට අවශ්‍ය අනෙකුත් සම්පත් ද මේ ලෙස භාවිතා කළ යුතු බව මම ප්‍රකාශ කරන්නට විය.

පාඩම තුළ ජීවත් වු නිසාදෝ මට දුරකථන ඇමතුම ලබා දුන් පුද්ගයා පිළිබඳව මතකය සිත තුළින් ගිලිහී යන්නට විය. සුරංජිත් අයියා ( ශක්‍ය ආයතනයේ හිමිකරු) මා අසලට විත් චින්තන සර් ඔයාව හම්බවෙන්න කෙනෙක් ඇවිදින් ඉන්නවා. මම ඉක්මනට මේ කොටස ඉවර කරලා එනකම් එයාට කියන්න ටිකක්  ඉන්න

කියලා. මාව මුණ ගැසීමට පැමිණෙන පුද්ගලයින්ව රස්තියාදු කිරීමට අකමැති වුවද මා එසේ පැවසුවේ සැබවින්ම පාඩම කරන්නමද නැතහොත් ඒ පුද්ගලයා කවුරු වුවද ඔහු තරණී පිළිබඳව කතා කිරීමට පැමිණ ඇති බව මා සිතන නිසා ද යන්න පැහැදිලිව වෙන්කර ගත නොහැක. මම කිසිවක් සිදු නොවූ ලෙස පාඩම ඉදිරියට කරගෙන යන්නට විය. ආර්ථිකය තුළ පවත්නා  සියලුම සම්පත් නිෂ්පාදනය සඳහා උපයෝජනය කරනවට අපි කියනවා පූර්ණ සේවා නියුක්තිය කියලා.

පූර්ණ සේවා නියුක්තිය අත්පත් කරගත් පමණින් ආර්ථිකයකට නිෂ්පාදන හැකියා වක්‍රයක් තුළ කටයුතු කරන්න පුලුවන් කමක් නැහැ. නිෂ්පාදන හැකියා වක්‍රය මත කටයුතු කරන්න නම් පූර්ණ නිෂ්පාදනයත් අත්පත් කර ගන්නට ඕනේ. එය නම් කිසිවෙකුට නොතේරුණ බව පෙනේ. සිනාවෙන් පිරී තිබූ මුහුණු මා කැත කළායැයි මට හැඟේ. පූර්ණ නිෂ්පාදනයක් කියන්නේ අපි අර කතා කරපු කුඹුරු ගත්තොත් මේ කුඹුරු වලින් ලබා ගත හැකි උපරිම වී බුසල් ප්‍රමාණය ලබා ගැනීමට කටයුතු කළ යුතුයි කියන එක.

මාව මුණ ගැසීමට පැමිණි පුද්ගලයා මා වෙනුවෙන් රස්තියාදු වන බව මා දැන දැනත් එම පුද්ගලයාව තව තවත් රස්තියාදු කල යුතුයැයි හැඟේ. මම පාඩම ඉදිරියට කරගෙන යන්නට විය. ඔයා හිතන්න ආර්ථිකය තුළ කුඹුරු පනහක් තියෙනවා කියලා . මේ කුඹුරු පනහම අපි නිෂ්පාදනයට උපයෝජනය කළහොත් අපි ඒකට කියනවා ................. කියලා. පංතිය තුළ හිස්තැන් පුරවන එක මගේ සාමාන්‍ය සිරිතයි. එහෙනම් පූර්ණ නිෂ්පාදනයක් අත්පත් කරගන්න ඕනා කියන්නේ මේ කුඹුරු පනහින් ලබා ගත හැකි උපරිම වී බුසල් ප්‍රමාණය ලබා ගත යුතු බවයි. මේ කුඹුරු පනහා පාවිච්චි කරලා වී බුසල් මිලියන 20ක් ගන්න පුලුවන්නම් නිෂ්පාදන හැකියා වක්‍රය මත කටයුතු කිරීමටනම් මේ මුළු නිෂ්පාදනය ලබා ගන්න ඕනේ. වී බුසල් මිලියන 18ක් 19ක් ලබා ගත්තා කියලා ආර්ථිකයට නිෂ්පාදන හැකියා වක්‍රය මත ලක්ෂයක කටයුතු කිරීමට හැකියාවක් ලැබෙන්නේ නැත.

එහෙනම් පැහැදිලියි නිෂ්පාදන හැකියා වක්‍රය මත කටයුතු කරන්න නම් සපුරා ගත යුතු කොන්දේසි දෙකයි.එනම්

1. පූර්ණ සේවා නියුක්තිය ( ආර්ථිකය තුළ පවත්නා සියලු සම්පත් නිෂ්පාදනයට උපයෝජනය කිරීම)

2. පූර්ණ නිෂ්පාදනය ( එම සම්පත් වඩාත් කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම).

මේ දෙකම එකට එකතු කරලා අපි කියනවා නිෂ්පාදන කාර්යක්ෂමතාවය කියලා. මම සිසුන්ට ලියා ගැනීම සඳහා සටහන කියවන්නට විය. පංතියේ දොර අසල නැවත සිටගෙන සිටිනුයේ සුරංජිත් අයියාය. සර් අර ළමයාට වේලා යනවලු. මම ඔහුව රස්තියාදු කරන එක සුදුසු නොවන බව මටද හැඟේ. සියල්ල නවතා මම සූදානම් වූයේ ඔහුව හමුවීමට යාමටය. අයියේ මම තාරක ඔයා පංතිය ඉවර කරන්නේ කීයටද? මම ඔහුට පංතිය අවසන් වන වේලාව පැවසුවද ඔහුට කිසිවක් පැවසීමටත් කලින් එහෙනම් මම එ වේලාවට එන්නම් අයියේ මට පුංචි වැඩකුත් තියෙනවා කරගන්න. ඔහුට මෙතරම් මා සමඟ කතා කිරීමට ඇති අවශ්‍යතාව කුමක් ද ? කිසිවක් වටහා ගත නොහැක. ඔහු මම සමඟ කුමක් පිළිබඳව ද කතා කරන්න යන්නෙ ද කියා නොවිමසා සිටියේ ඔහු ප්‍රකාශ කරන්න යන්නේ සිතට දුකක් ගෙන දෙයක් විය හැකියැයි සිතූ නිසාවෙනි. එසේ වුවහොත් දේශනය නිවැරදිව කරගෙන යාමට නොහැකි වනු ඇත. එහෙනම් ඔයා ඒ වේලාවට එන්න අපි කතා කරමු.

මම නැවතත් පංතිය තුළය යන්නේ සිත තුළ සිතා ගත නොහැකි දුකක් වැනි දෙයක් රැඳවාගෙනය. එහෙනම් පැහැදිලිද අපි කතා කරපු ටික. සිසුන් සියලු දෙනාම ඔළුව පහළට වැනුවේ තේරුණ බව හැඟවීමටය. එහෙත් කීයෙන් කී දෙනක්නම් මේ කරුණු ටික නිවැරදිව අවධාරණය කරගන්න ඇද්ද ? සමහරුන් පංති වලට පැමිණෙන්නේ අධ්‍යාපන කටයුතු කිරීමට නොව ගුරුවරුන් කියන රස කතා අසා විනෝද වී යමටය. එ වැනි අය  තම දෙමව්පියන්ගේ මුදල් නේද නාස්ති කරන්නේ කියා තේරුම් ගන්නෙ නම් මේ සමාජය කොතරම් ලස්සන වනු ඇද්ද? එසේ වන්නෙ නම් ශ්‍රී ලංකාවට ද සංවර්ධිත රටක් බවට පත් වීමට එතරම් කාලයක් නොයෙනු ඇත.

ආර්ථික කාර්යක්ෂමතාවය යන්න නිෂ්පාදන කාර්යක්ෂමතාවයෙන් වෙන්කර හඳුනාගත යුතුය. ආර්ථික කාර්යක්ෂතාව අත්කර ගැනීමට නම් නිෂ්පාදන කාර්යක්ෂමතාවයට අමතරව සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාවයද අත්පත් කරගත යුතුය. මම පාඩම පැහැදිලි කර ගෙන යන්නට විය. ඒ අතර එක්තරා පිරිමි ළමයෙක් පසු පෙළෙහි තම දුරකථනය සමඟ  සෙල්ලම් කරන්නට විය. මම ඔහුට ඔරවනවාත් සමඟම ඔහු තම දුරකථනය සඟවා ගත්තේ කිසිදු වරදක් නොකළ අයුරෙනි. මම කිසිවක් නොපවසා පාඩම ඉදිරියට ගෙන ගියේ ඔහු තම වැරැද්ද තේරුම් ගත් නිසාවෙනි.







සම්පත් බෙදා වෙන් කිරිමේ කාර්යක්ෂමතාවය කියන්නේ සමාජය වඩාත් කැමැත්තක් දක්වන භාණ්ඩ හා සේවා පමණක් නිෂ්පාදනය කිරිමට හිඟ සම්පත් බෙදා වෙන්කළ යුතු බවයි. සම්පත් බෙදාවෙන් කිරීමේ කාර්යක්ෂමතායව අත්පත් කර ගැනිමට නම් කිසියම් භාණ්ඩයක මිල එම භාණ්ඩයේ ආන්තික පිරිවැයට සමාන විය යුතුය.

නැවතත් මාගේ දුරකථනය නාද වෙන්නට විය. මම පුදුමයෙන් මෙන් දුරකථනය දෙස බැලුවේ ඒ දුරකථන අංකය වෙනකාගෙවත් නොව මාගේ සිත ඇලුම් කරන තරණිගේය. මම දුරකථනය අන්ස්වර් නොකර ගනන් උස්සන්නට වූයේ ඇයට අවශ්‍ය නම් නැවත දුරකථන ඇමතුමක් ගනු ඇතැයි සිතාය. එහෙත් ඒ බව දැනගෙන දෝ ඇය නැවත දුරකථන ඇමතුමක් නොගන්නට විය. මේ සිදුවන්නේ මොනවාද යන්න මට කිසිවක් සිතා ගත නොහැකිය. මව හමුවීමට පැමිණි පිරිමි ළමයාත්, තරණිගේ ඇමතිමත් අතර කුමක් හෝ දෙයක් ඇතැයි මට හැඟේ. ඒ කුමක් දැයි වටහා ගැනීමට නොහැකිය. මම තව දුරටත් පාඩම ඉදිරියට කරගෙන ගියේ තරණි නැවත අමතනු ඇතැයි යන බලාපොරොත්තුවෙනි.

අපිට සම්පත් බෙදා වෙන්කිරිමේ හැකියාව නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයකින් නිරූපණය කළ හැකිය. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත ලක්ෂයන් අතුරෙන් කිසියම් එක් ලක්ෂයකින් සම්පත් බෙදාවෙන්කිරිමේ කාර්යක්ෂමතාවය නිරූපණය කළ හැකිය.

අපි බලමු කොහොමද මෙය නිෂ්පාදන හැකියා වක්‍රයකින් නිරූපණය කරන්නේ කියලා.

තරණිගෙ දුරකථන අංකයෙන් මගේ දුරකථනය නැවත නද වන්නට විය. එවර මම දුරකථනයෙන් ඇය ඇමතුවේ ඇය මා සමඟ කතා කිරිමට ඇති අවශ්‍යතාව දැන ගැනිමේ අරමුණින්ය. චින්තන අයියේ මම තරණි.







පුර්ණ සේවා නියුක්තිය අත්පත් කරගත් පමණින් ආර්ථිකයකට නිෂ්පාදන හැකියා වක්‍රයක් තුළ කටයුතු කරන්න පුලුවන් කමක් නැහැ.







